# මනුෂ්‍ය ජීවිතය කෙරෙහි පාරභෞතිකවාදයේ දායකත්වය: දාර්ශනික සහ සමාජ-මනෝවිද්‍යාත්මක විග්‍රහයක්

# (The Contribution of Metaphysics to the Human Life: A Philosophical & Socio-Psychological Analysis)


වී. ජී. චාමලී රුවන්දිකා විදානගම

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි (දර්ශනය)

FGS/03/02/07/2011/01


දර්ශනපති (දර්ශනය) උපාධිය සඳහා

කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත

ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය


2015 පෙබරවාරි

# සාරාංශය

**"මනුෂ්‍ය ජීවිතය කෙරෙහි පාරභෞතිකවාදයේ දායකත්වය:දාර්ශනික සහ සමාජ-මනෝවිද්‍යාත්මක විග්‍රහයක්"** යන මාතෘකාව යටතේ සිදුකරන ලද මෙම අධ්‍යයනය මූලික වශයෙන් පාරභෞතිකවාදයේ ස්වභාවය සහ මනුෂ්‍ය ජීවිතය කෙරෙහි එමගින් සිදුකරන බලපෑම පිළිබඳව කරනු ලබන විමර්ශනයකි. පාරභෞතිකවාදය පිළිබඳ පැහැදිලි විවරණයක් පළමුව දක්නට ලැබෙන්නේ ඇරිස්ටෝටලියානු චින්තනය තුළයි. නමුත් ඊට පෙර සිට ම තේලිස් නමැති මෙමිලේසියානු දාර්ශනිකයාගෙන් ඇරඹෙන බටහිර චින්තනය තුළ සහ සෘග්වේද අවධියෙන් ඇරඹි ඉන්දීය චින්තනය තුළත් පාරභෞතිකවාදී ලක්ෂණ අන්තර්ගත බව හඳුනාගත හැකිය. මේ දාර්ශනික සම්ප්‍රදායයන් පාරභෞතිකවාදය කෙරෙහි දක්වූ ආකල්ප අතර සමානතා දක්නට ලැබෙනුයේ මේ ආරම්භක අවධීන් තුළ ඔවුන්ගේ ජීවන රටාවන්හි දක්නට ලැබුණු සමානතා නිසා බව පෙනේ. එසේ වුවත් බටහිර දාර්ශනිකයින් ආනුභූතික ලෝකය පිළිබඳ ස්වභාවවාදී විමර්ශන ඉදිරිපත් කරද්දී ඉන්දීය චින්තකයින් මනුෂ්‍ය ජීවිතය දුකින් මුදවා ගැනීම සඳහා උත්සාහයක නිරතවී ඇත. ඒ අනුව පාරභෞතිකවාදය මේ සම්ප්‍රදායයන් තුළ එකිනෙකට වෙනස් පදනම් තුළ වර්ධනය වූ බව පෙනේ. මෙහි දී බටහිර දාර්ශනිකයින් සිය ගැටලුවලට ආනුභූතික ලෝකය ඇසුරෙන් පිළිතුරු ලබා ගැනීමට නොහැකිවීම නිසා පාරභෞතිකවාදය දෙසට යොමු වූ අතර ඉන්දීය චින්තකයින් අනිත්‍යතාවෙන් යුත් ලෝකයේ දුක් කම්කටොලු වලින් මනුෂ්‍ය ජීවිතයට විමුක්තිය ලබාදීම සඳහා සිය මානසික ශක්තිය වර්ධනය කිරීම තුළින් ආනුභූතික තත්ත්වයන් ඉක්මවා යාමට ක්‍රියා කළ බව දක්නට ඇත. මෙහි දී ඉන්දීය චින්තකයින් අනුභූතිය ඉක්මවා ගිය අතීන්ද්‍රිය අනුභූතිය ද සත්‍ය ඥාන මාර්ගයක් වශයෙන් පිළිගෙන ඇති බව පෙනේ.

පාරභෞතිකවාදය සම්බන්ධයෙන් ප්‍රබල විවේචන එල්ලකර ඇත්තේ භෞතිකවාදී දාර්ශනිකයින් විසිනි. පෙර පර දෙදිගම මේ අදහස් පිළිගත් අයගෙන් අඩුවක් නොවිය. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂමය සාක්ෂි වලින් බැහැර වූ කිසිවක් පිළිගන්නට මේ අය මැළි වූහ. නූතන විද්‍යාව සහ විද්‍යාත්මක අනුභූතිවාදය ද පූර්ණ වශයෙන් ම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය ඇසුරෙන් සාධනය වන්නකි. එහි දී ද පාරභෞතිකවාදය ප්‍රතික්ෂේප කරනු ලැබුවත් විද්‍යාත්මක ක්‍රමවේදයේ පවත්නා සීමිතතාවන් නිසා පාරභෞතිකවාදය පූර්ණ වශයෙන් ම පිළිගැනීමට හෝ බැහැර කිරීමට ප්‍රමාණවත් සාධනයක් විද්‍යාත්මක ක්‍රමවේදය ඇසුරෙන් ඉදිරිපත් කළ හැකි වන්නේ ද යන්න තවදුරටත් ගැටලු සහගත බව පෙනේ.

පුද්ගල චර්යාව හැමවිට ම අසීමිත අවශ්‍යතාවන් මගින් මෙහෙයවනු ලබයි. සිය අවශ්‍යතා සම්පූර්ණ නොවීමත් සමගින් පුද්ගලයා ඉච්ඡාභංගත්වයට, මානසික අසමතුලිතතාවයන්ට පත්වන බව නිරීක්ෂණය වූ වැදගත් කරුණකි. මෙසේ සිය අපේක්ෂාවන් සන්තර්පනය නොවුනත් ඒවා සම්පූර්ණයෙන් ම අත්හරින්නට ද පුද්ගලයා කැමැත්තක් නොදක්වයි. එවැනි අපේක්ෂාවන් සිය ජීවිතයේ ඕනෑම අවස්ථාවක දී හෝ එසේ නොමැති වුවහොත් මතු භවයේ දී හෝ සම්පූර්ණ කර ගැනීමේ අරමුණ ඇතිව ඒවා තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පුද්ගලයා තුළ පවතී. මේ ලෙස අසීමිත වූ අපේක්ෂාවන් සමගින් සිය ජීවිතය පවත්වාගෙන යාම පුද්ගල ජීවිතයේ සුවිශේෂී ලක්ෂණය බව පෙනේ. ඒ සඳහා පාරභෞතිකවාදී ආකල්ප පුද්ගලයාට සුවිශේෂී දායකත්වයක් ලබා දෙයි. මිනිසාට සෑම පාරභෞතික විශ්වාසයක් ම කිසියම් උපයෝගීතාවක් ලබා දෙන බැවින් අපේක්ෂාවන්ගෙන් බැහැර වූ ජීවිතයක් පිළිබඳව සිතන්නට පවා පුද්ගලයා මැළි වන බව පෙනේ. පාරභෞතිකවාදයෙන් තොරව මනුෂ්‍ය ජීවිතය අර්ථ ශූන්‍ය එකක් බවට පත්වීමට ද ඉඩ ඇති බැවිනි.

**ප්‍රධාන වචන:** පාරභෞතිකවාදය, අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය, බුද්ධදහම, දර්ශනය, ඉන්ද්‍රිය අනුභූතිය